# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2030/11 - 2017 ජූලි මස 31 වැනි සඳුදා - 2017.07.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත

**බලතල පැවරීමේ නියෝග**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලපවහන ආහාර සැපයීම් හා බෙදාහැරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම, දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහය වීම සඳහා පත් කර ඇත්තාවූ පහත දක්වා ඇති උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් අය වෙත 1983 අංක 32 හා 1992 අංක II දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ හා ඒ යටතේ පනවා ඇති රීති ප්‍රකාරව සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියළු බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,
කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා
ජලපවහන ආහාර සැපයීම් හා බෙදාහැරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය,
දකුණු පළාත.

2017 ජුනි මස 28 වැනි දින,
ගාල්ලේ දී ය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| අනුරසිරි මුතුමාල මයා | 2017.06.20 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 42, 43, 44, (44(6), හැර) 45, 46, 48, 49, 50, 52, 53, 54, 58, (58(2) (අ) හා 58(5) හැර) 59, 68 සහ 72 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල. |

1A - PG 3631 — 10 (2017/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| අනුරසිරි මුතුමාල මයා | 2017.06.20 | රීති මාලාවේ 4, 11, 15, 16(11), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (49 xii හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල. |

08 - 509

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.